# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## කතෝලික ධර්මය

විභාග අංකය : ...............................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

සැලකිය යුතුයි : අංක 1 සිට 40 දක්වා දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. ශුද්ධ වූ බයිබලය ලේඛන ගත වූ කාලය වන්නේ,

   (i) ක්‍රි. පූ. 950 - ක්‍රි. පූ. 100 (ii) ක්‍රි. ව. 950 - ක්‍රි. පූ. 100
   (iii) ක්‍රි. ව. 950 - ක්‍රි. පූ. 100 (iv) ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100

2. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය ගැන සඳහන් වන්නේ,

   (i) රූත් හා එස්තර් ය (ii) රූත් සහ නෙහෙමියා ය
   (iii) එස්රා හා නෙහෙමියා ය (iv) එස්රා හා එස්තර් ය

3. අපෝස්තලික යුගයේදී ශුද්ධවූ සභාවට මහඟු සේවයක් ඉටු කළ විශිෂ්ඨ පුද්ගලයා වන්නේ,

   (i) පේදුරු තුමා (ii) පාවුලු තුමා.
   (iii) ජොහන් තුමා (iv) ජාකොබ් තුමා

4. පහත සංදේශ අතරින් ආරූඪ කතෘත්වය හා ද්විතීය පාවුලු සංදේශයට අයත් වරණය වන්නේ,

   A - රෝම C - තීසිස්
   B - එපිස D - ගලාති

   (i) A, B (ii) B, C (iii) C, D (iv) A, D

5. පරම යහපත හා පරම අයහපත අතර ගැටුමෙන් අනාගතයේ දිනකදී පරම යහපත ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරන්නේ,

   (i) ද්විත්වවාදයෙනි (ii) සංකේත භාවිතයෙනි
   (iii) යුගාන්තවාදයෙනි (iv) ගුප්තභාවයෙනි

6. ක්‍රි. පූ. 101 – 104 පමණ කාලයේ සිටි සිරියානු අධිරාජයා වන්නේ,

   (i) i වන ඇන්ටිඕකස් (ii) ii වන ඇන්ටිඕකස්
   (iii) iii වන ඇන්ටිඕකස් (iv) iv වන ඇන්ටිඕකස්

7. ශුද්ධ වූ පාවුලු තුමාට ගැඹුරු ඥානයක් තිබුණේ කුමන ක්ෂේත්‍ර සඳහා ද ?

   (i) ජුදා දහම, නීතිය, ව්‍යවස්ථාව (ii) නීතිය, ව්‍යවස්ථාව, ඉගැන්වීම
   (iii) ව්‍යවස්ථාව, ඉගැන්වීම හා ජුදා දහම (iv) ජුදා දහම, නීතිය, ඉගැන්වීම

8. ශුද්ධවූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට අතරමගදී එක්වූයේ,

(i) ලූක් තුමා, (ii) ජොහන් තුමා
(iii) තිමෝතියස් තුමා (iv) සීලස් තුමා

9. "ඔබ ක්‍රිස්තුවරයාණෝය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ" යි ප්‍රකාශ කළේ,

(i) ශු. පේදුරු තුමා (ii) ශු. පාවුලු තුමා
(iii) ශු. ස්තේපන් තුමා (iv) ශු. ජාකොබ් තුමා

10. ක්‍රි. ව. 1543 දී ශ්‍රී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වන්නේ ,

(i) ජේසු නිකාය (ii) අගුස්තීනු නිකාය
(iii) දොමිනිකාන නිකාය (iv) ෆ්‍රැන්සිස්කාන නිකාය

11. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කර ගත නොහැකිය." මෙසේ ප්‍රකාශ කළේ, ,

(i) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා (ii) මැක්ෂිමිලියන් කෝල්බේ පියතුමා
(iii) ජුසේ වාස් පියතුමා (iv) මයිකල් රොද්‍රීගු පියතුමා

12. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයක් නොවන්නේ,

(i) ප්‍රසාද නිධානයකි (ii) කුසලානයකි
(iii) යාගයකි (iv) තුති පිදීමකි

13. ප්‍රථම වරට පූප සහ මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ කුමන නුවරක පූජකතුමෙක් ද ?

(i) සාලෙම් නුවර (ii) කානා නුවර
(iii) කපර්නාවුමේ (iv) ගලීලයේ

14. සුභාරංචි කතුවරුන් සතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්ය වන්නේ,

(i) අංශභාග රෝගියා සුව කිරීම (ii) පූප වැඩිකිරීම
(iii) ලාදුරු රෝගීන් සුව කිරීම (iv) ජලය මිදිරසට හැරවීම

15. භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය ආරම්භ කළ නිකාය වන්නේ,

(i) දයාවේ දූතිකාවේ නිකාය (ii) ලොරෙට්ටෝ නිකාය
(iii) යහපත් එඬේරා නිකාය (iv) ශුද්ධවූ පවුලේ නිකාය

16. දෙවියන් වහන්සේ මිසරවාසීන්ට එවූ අවසන් (දහවන) වසංගතය වන්නේ,

(i) ගල් වර්ෂාව (iii) කුළුඳුලන් මැරීම
(iii) පළඟැටි උවදුර (iv) වතුර ලේ කිරීම

17. "ජීවමාන සාන්තුවරිය" යන විරුදාවලිය ලබා ඇත්තේ,

(i) ශු. මරිය ගොරෙට්ටි තුමිය (ii) මරිය තුමිය
(iii) භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය (iv) ශු. මොනිකා තුමිය

18. "බලාපොරොත්තුවේ එළිපත්ත" නමැති පොත රචනා කරන ලද ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(i) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (ii) xiv වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(iii) xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා (iv) ii වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

19. "සේවක සෙවන" නමැති ස්ථානයේ දෙව්සත්හලක් පවත්වා ගෙන යමින් පූජක සේවය ජනතා හදගැස්මට ලංකලේ,

(i) මයිකල් රුද්‍රිගු පියතුමා (ii) ජුසේ වාස් පියතුමා
(iii) තෙරේසා මව්තුමිය (iv) ගොන්සාල්වෙස් පියතුමා

20. "මම පූජාවලට වඩා කරුණාවට කැමැත්තෙමි. දවන යාග පූජාවලට වඩා දෙවියන් වහන්සේ පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි." මෙසේ සඳහන් කරන දිවැසිවරයා,

(i) හොසියා (ii) යෙසායා
(iii) එසෙකියල් (iv) ජෙරමියා

21. තම ගැළවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යයි බලාපොරොත්තු නොවීම,

(i) ඉච්චාභංගත්වය යි (ii) අනුමානය යි
(iii) සාමය යි (iv) ප්‍රේමය යි

22. ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට අප විසින් කළ යුතු පළමු යුතුකම වන්නේ,

(i) විවිධ භක්ති අභ්‍යාසවල යෙදීම (ii) දිව්‍ය පූජාවට සහභාගි වීම
(iii) දහම් පාසලට සහභාගි වීම (iv) රෝගීන් බැලීමට යාම

23. දේව වේද පුරාණය, මංගල ගීතය, පසන් පොත, - මෙම ග්‍රන්ථ රචනා කළේ,

(i) ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමා (ii) ජුසේ වාස් පියතුමා
(iii) මයිකල් රුද්‍රිගු පියතුමා (iv) මර්සලින් ජයකොඩි පියතුමා

24. ශුද්ධවූ ස්තේපන් තුමාට ගල් ගසා මරා දමන විට සතුට ප්‍රකාශ කළේ,

(i) හෙරෝද් (ii) සාවුල්
(iii) පිලාත් (iv) ජුදෙව්වන්

25. පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේ නාඳුනන බව කී වරක් ප්‍රකාශ කළේද ?

(i) දෙවරක් (ii) සතරවරක්
(iii) තුන්වරක් (iv) පස්වරක්

26. ක්‍රිස්තුන් වහන්සේගෙන් බැඳීමටද, මිදීමට ද, විශේෂ බලයක් ලැබුවේ,

(i) ශු. පේදුරු තුමා (ii) ශු. පාවුලු තුමා
(iii) ශු. ස්තේපන් තුමා (iv) ශු. ජොහන් තුමා

27. “වීර සෙබළා" සඟරාව හා “සත්‍යය" නමැති ලිපි රචනා කළේ,

(i) ජුසේ වාස් පියතුමා (ii) ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමා
(iii) මයිකල් රුද්‍රිගු පියතුමා (iv) මැක්සිමිලියන් කෝල්බේ පියතුමා

28. ශුද්ධවූ පාවුලු තුමා තම ධර්මදූත චාරිකා තුනම ආරම්භ කළේ,

(i) පිසිදියේ අන්තියෝකියෙනි (ii) සිරියාවේ අන්තියෝක්තියෙනි
(iii) ජෙරුසලමෙනි (iv) දර්බයෙනි

29. ජේසුස් වහන්සේ පාස්කු ඉරුදින සවස අපෝස්තුළුවරුන් වෙත වැඩම කර ප්‍රකාශ කළේ,

(i) ‘ඔබට සාමය වේවා’ (ii) ‘ඔබට කරුණාව ලැබේවා’
(iii) ‘ඔබට දීර්ඝායු වේවා’ (iv) ‘ඔබට ශාන්තිය වේවා’

30. පාස්කු මංගල්‍යයෙන් පසු ජුදා ආගමිකයන්ගේ ප්‍රධාන මංගල්‍ය වූයේ,

(i) පෙන්තකොස්ත මංගල්‍යය (ii) අස්වනු නෙළීමේ මංගල්‍යය
(iii) නැඹුල් එල ඔප්පු කිරීමේ මංගල්‍යය (iv) තුති පිදීමේ මංගල්‍යය

31. පේදුරු තුමාගේ ප්‍රථම දේශනයෙන් පසු මනස්ථාපනය වී බෞතිස්මය ලැබූ ගණන,

(i) 2000 කි. (ii) 3000 කි.
(iii) 1000 කි. (iv) 4000 කි.

32. මුල් කිතුණු සභාවේ 'සහණාධාර බෙදීම' සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීමට පත් කළේ,

(i) ප්‍රේරිතවරුන් (ii) ශතාධිපතියන්
(iii) උපස්ථායකයන් (iv) නායක පූජකයන්

33. විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය මත පදනම් වන්නේ දසපනතේ කීවෙනි පනත ද ?,

(i) තුන්වන (ii) දෙවන
(iii) නමවන (iv) පළමු

34. 'මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ ආත්මය මිදුම්කාර දෙවිඳුන් ගැන උදම් අනයි' මෙසේ ප්‍රකාශ කළේ,

(i) මරියතුමිය (ii) ක්‍රිස්තුන් වහන්සේය
(iii) එලිසබෙත් තුමිය (iv) පේදුරු තුමාය

35. දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය වන්නේ,

(i) ශුද්ධ බයිබලයයි (ii) පූප හා මිදිරසයි
(iii) කුරුසියයි (iv) දේවස්ථානයයි

36. සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,

(i) ධන සම්පත ය (ii) ප්‍රඥාව ය
(iii) දීර්සායුෂ ය (iv) ලෞකික සැප සම්පත් ය

37. හුදෙක් නුඹේම නුවණෙහි නොපිහිටා, මුළු හිතින් හිමි තුම කෙරෙහි .......... තබන්න. හිස් තැනට සුදුසු වචනය වන්නේ,

(i) ගෞරවය (ii) කරුණාව
(iii) ආදරය (iv) විශ්වාසය

38. දෙවියන් වහන්සේ විසින් පොරොන්දු වන ලද ගැලවීම මානව සංහතියට හිමි වූයේ ක්‍රිස්තුන් වහන්සේගේ,

(i) උකුත් වීමෙනි (ii) කුරුසියේ ඇණ ගැසීමෙනි
(iii) උත්ථාන වීමෙනි (iv) දුක් විඳීමෙනි

39. "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනි" මෙසේ ප්‍රකාශ කළේ,

(i) පේදුරු තුමා (ii) තෝමස් තුමා
(iii) ජොහන් තුමා (iv) ජාකොබ් තුමා

40. තම රෝම පුරවැසිභාවය පදනම් කර ගෙන රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලුවේ, ,

(i) ශු. පාවුලු තුමා (ii) ශු. පේදුරු තුමා
(iii) ශු. ස්තේපන් තුමා (iv) ශු. කෝල්බේ තුමා

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## කතෝලික ධර්මය

විභාග අංකය : ................................

| | | |
|---|---|---|
| I0 ශ්‍රේණිය | I I පත්‍රය | කාලය පැය 02 |

පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු ලියන්න

(1) (i) ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘ හා උපකතෘ ලියන්න.

(ii) ශුද්ධවූ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථ දෙකක් ලියන්න.

(iii) පාස්කු භෝජනයේ මූලිකාංග 2 ක් ලියන්න.

(iv) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් 2 ක් නම් කරන්න.

(v) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් විය යුතු ආකාර 2 ක නම් කරන්න.

(vi) එළිදරව් සාහිත්‍යයේ දක්නට ලැබෙන සංකේත වර්ග දෙකක් ලියන්න.

(vii) ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප 2 ක් ලියන්න.

(viii) මුල් කිතුණු සභාවේ ලක්ෂණ හතර ලියන්න.

(ix) ශු. සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා හා අපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතරින් ප්‍රාණපරිත්‍යාගිවරයන් වූ දෙදෙනා නම් කරන්න.

(x) ජේසුස් වහන්සේ පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යයන් අතුරින් දෙකක් ලියන්න.

(2) (i) දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍ර 2 මොනවාද ?

(ii) පුරාණ ගිවිසුමට අයත් ඉතිහාස පොත් 3 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ පිළිබඳ සුබාරංචිය අන් අය වෙතට ගෙන යාමට ඔබ කරන යෝජනා 5 ක් ලියා විස්තර කරන්න.

(3) (i) ධර්මදූත චාරිකා වලදී පාවුලු තුමාට මුහුණ දීමට සිදුවූ බාධා/අභියෝග දුක්කම්කටොළු දෙකක් ලියන්න.

(ii) ජෙරුසලමේ චතුරශ්‍රයේ දී පේදුරු තුමා කළ ප්‍රථම දේශනය තුළ අන්තර්ගත කරුණු 3 ක් ලියන්න.

(iii) ශුද්ධාත්ම බලය ලැබූ ඔබ විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දැරූ අවස්ථා 5 ක් ලියන්න.

(4) (i) ශුද්ධ වූ සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) පෘතුගීසි යුගයේ මෙරටට පැමිණි ධර්මදූත නිකායන් තුනක් ලියන්න.

(iii) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

(5) (i) ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.

(ii) වෙනත් හසුන් ලියූ ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරු තිදෙනෙක් ලියන්න.

(iii) ඉරුදින දිව්‍ය පූජාවේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ පසු කිව හැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න. .

(6) (i) පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පර්මාර්ථ දෙක ලියන්න.

(ii) ඉශ්‍රායෙල් ජනතාව මිසරයේදී කළ වහල් සේවාවන් 3 ක් ලියන්න.

(iii) නූතන තරුණ සිසු දරුවන් මුහුණ දී ඇති වහල්භාවයන් 5 ක් ලියා විස්තර කරන්න.

(7) පහත සඳහන් ඒවා අතරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

(i) ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීම.

(ii) ශුද්ධවූ පේදුරු තුමා

(iii) නව ගිවිසුමේ පොත් වර්ගීකරණය

(iv) අතී උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා